**<u>පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නේවාසික ශාලා වල නේවාසික පහසුකම් ලද පළමු වසර සිසුන් සඳහා ක්‍රියාත්මක කළ යුතු නීති සහ මාර්ගෝපදේශයන්</u>**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඔබව සාදරයෙන් පිළිගනිමු. විශ්වවිද්‍යාලය මගින් මෙම දුෂ්කර කාලයේදී ඔබව සුවපහසු සහ වඩාත් ආරක්ෂිතව තබා ගැනීමට සියලු උත්සාහයන් දරයි.

ඔබට නියමිත නේවාසික ශාලාවට පැමිණි පසු පළමු දිනයේම ශාලාවේ ශාලාධිපති, උපශාලාධිපති, අධ්‍යයන උපශාලාධිපති සහ ශාලාවේ නේවාසිකව සිටින අනෙකුත් සියලුම කාර්මණ්ඩලයේ සහභාගිත්වයෙන් රැස්වීමක් කැඳවා ඔබ ශාලාවේ රැඳී සිටින කාලය තුල අනුගමනය කළ යුතු නීති රීති සහ ක්‍රියාපටිපාටි පැහැදිලි කරනු ඇත.

ඒ අනුව නවක සිසුන් නේවාසික ශාලාවේ රැඳී සිටින පළමු මාස 3 තුළ අනුගමනය කළ යුතු නීති පහත දැක්වේ.

- පෙව 7.00 ට පෙර ඔබට ශාලාවෙන් පිටවීමට අවසර නැත.
- ඔබ ඔබේ අධ්‍යයන කටයුතු අවසන් කර සවස 6.00 ට පෙර ශාලාවට පැමිණිය යුතුයි.
- සති අන්තයේ හෝ රජයේ නිවාඩු දිනවල නිවෙස් බලා යාමට හෝ වෙනත් කිසිදු කරුණකට ශාලාවෙන් පිටවීමට ඔබට අවසර නැති බව කරුණාවෙන් සලකන්න.
- නිවෙස් බලා යාම හෝ නේවාසික ශාලාවෙන් පිටවීමට අධ්‍යයන වැඩසටහන අවසන් වන තුරු සහ පීඨාධිපතිවරයාගේ අවසරය ලැබෙන තුරු ඔබ නේවාසිකාගාරයේ රැඳී සිටිය යුතුය.
- ඉහත නීති රීති වලට පටහැනිව කටයුතු කරන සිසුන් ආපසු ශාලාවට පැමිණි පසු දින 14ක් නිරෝධායන මධ්‍යස්ථානයක නිරෝධායනයට ලක් කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.
- ඔබට ඔබේ අධ්‍යයන වැඩසටහනෙන් පිටත හෝ සාමාන්‍ය වේලාවෙන් පිටත (පෙව 7.00 සිට සවස 6.00 දක්වා) පීඨයේ හෝ විශ්වවිද්‍යාලයේ වෙනත් ස්ථානයක පවත්වනු ලබන කුමන හෝ කාර්යයකට සහභාගී වීමට අවශ්‍ය නම්, ඔබ පීඨයේ පීඨාධිපතිවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් ශාලාධිපතිට හෝ උපශාලාධිපතිට ඉදිරිපත් කර නේවාසික ශාලාවෙන් පිටවීම සඳහා අවසර ගත යුතුය.

**කෝවිඩ්-19 වැලැක්වීම**

- ඔබ කෝවිඩ්-19 රෝගය අසාදනය වීමෙන් වැළැක්වීම සඳහා නිර්දේශිත සියලුම සෞඛ්‍ය නීති සහ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද කෝවිඩ්-19 වැළැක්වීමේ මාර්ගෝපදේශ නේවාසිකාගාරයේ සහ සියලුම පොදු ස්ථානවල පල කර ඇති අතර ඔබ ඒවා අනුගමනය කළ යුතුය.
- ඔබ සෑම විටම පිරිසිදු හා සුදුසු මුහුණු ආවරණයක් පැළඳ සිටිය යුතය. අවම වශයෙන් මීටරයක දුරස්ථභාවයක් පවත්වා ගැනීම, නිතර සබන් දමා අත් සේදීම, ඇස් නාසය හෝ මුඛය ස්පර්ශ කිරීමෙන් වැළකීම, නේවාසිකාගාර කාමරයේ හෝ ඔබ කණ්ඩායමේ අනෙකුත් සිසුන්ගේ පුද්ගලික දෑ ස්පර්ශ කිරීමෙන්/භාවිත කිරීමෙන් හෝ බෙදා හදා ගැන්මෙන් වැළකීම ආදී සෞඛ්‍ය නීති අනුගමනය කළ යුතුය.
- ශාලාවේ පොදු ස්ථානවල ආහාර ගැනීමට ඔබට අවසර නැත. ආපනශාලාවෙන් ආහාර ගැනීමෙන් පසු ඔබ ඔබේ කාමරය තුළ ආහාර ගත යුතුය.
- ඔබේ පෞද්ගලික භාවිතය සඳහා වතුර බෝතල්, කෝප්ප සහ පිඟන් තිබිය යුතුය. ආපනශාලා හිමිකරුවන් විසින් පිඟන් හෝ කෝප්ප ඔබට ලබා නොදෙන බව කරුණාවෙන් සලකන්න.
- ඔබට උණ, සෙම්ප්‍රතිශ්‍යාව, දරුණු හිසරදය හෝ නාසයෙන් සොටු දියර ගැලීම, කැස්ස, උගුරේ අමාරුව, හුස්ම හිරවීම වැනි ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් වහාම නේවාසික ශාලාවේ බලධාරීන්ට දැනුම් දිය යුතුය.
- පහත කරුණු සම්බන්ධයෙන් ශාලාධිපති, උපශාලාධිපති, විනයපාලක, ප්‍රධාන විනයාරක්ෂක නිලධාරි හෝ විනයාරක්ෂක නිලධාරීන් හෝ සෞඛ්‍ය මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය විසින් ඔබට ලබා දෙන උපදෙස් සහ නිර්දේශ ඔබ අනුගමනය කළ යුතුය.
    - ශාලාව තුල හුදකලා කිරීම (Isolation)
    - පරීක්ෂා කිරීම (PCR & RAT)
    - නිරෝධායනය හෝ වෙනත් සෞඛ්‍ය සම්බන්ධ ක්‍රියා පටිපාටි
- ශාලා බලධාරීන්ගේ/විනයාරක්ෂක නිලධාරීන් හෝ වෙනත් නම් කරන ලද විශ්වවිද්‍යාල පාලන අධිකාරිය මගින් නිර්දේශ කරනු ලබන සෞඛ්‍ය උපදෙස්

පිළිපැදීමට ශිෂ්‍යයෙකු එකඟ නොවන්නේ නම්, ඔහු හෝ ඇය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන සෞඛ්‍ය මධ්‍යස්ථානයකට (හුදකලා හෝ නිරෝධායනය) මාරු කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

- තමාගේ හෝ තම කාමරයේ හෝ තම කණ්ඩායමේ සිටින ශිෂ්‍යයෙකු හෝ කෝවිඩ්-19 රෝග ලක්ෂණ හිතාමතාම සැඟවීමට උත්සාහ දැරීම බරපතල වරදකි. එවැනි ක්‍රියාවල නිරත වන සිසුන්ට එරෙහිව දැඩි විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.
- සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අපොහොසත් වීම නැවත නේවාසික පහසුකම් ලබා නොදීමට හේතුවන බව කරුණාවෙන් සලකන්න.

**සියලුම නේවාසික සිසුන් සඳහා වන වෙනත් පොදු නීති**

- නේවාසික ආපානශාලාවෙන් උදේ ආහාරය සහ රාත්‍රී ආහාරය ලබා ගත යුතුය.
- නේවාසික ශාලාවේ භෝජනාගාරය තුළ කණ්ඩායම් වශයෙන් ආහාර ගැනීමට හෝ අවසර නැත. ආහාර ඔබේ කාමරයට ගෙන ගෙස් අනුභව කළ යුතුය.
- ආහාර සැපයීම හෝ බෙදා හැරීමේ සේවා මගින් (delivery service, Uber or Pickme) ආහාර ඇණවුම් කිරීමට ඔබට අවසර නැත.
- රැස්වීම්, සාකච්ඡා, කණ්ඩායම් ක්‍රීඩා, කණ්ඩායම් පන්ති හෝ සිසුන් විශාල වශයෙන් එක් ස්ථානයකට එක්රැස් කරනු ලබන ක්‍රියාකාරකම් නේවාසික ශාලා තුළ හෝ ඒ ආසන්නයේ හෝ විශ්වවිද්‍යාලයේ වෙනත් පරිශ්‍රයක පැවැත්වීම සපුරා තහනම් වේ.
- තනි පුද්ගල යෝග්‍යතා අභ්‍යාස සහ ව්‍යායාම වල සියලු සෞඛ්‍ය නීති පිළිපදිමින් නිරත වීමට ඔබට අවසර නැත.

**මෙයට අමතරව දැනට පනවා ඇති නේවාසිකාගාර සඳහා වන නීති රෙකුලාසි එලෙසින්ම නොවෙනස්ව පවතින බව සැලකිය යුතුය.**